*සියලුම හිමිකම් ඇවිරිණි*
*All Rights Reserved*

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# තෙවන වාර පරීක්ෂණය 2018

# නාට්‍ය හා රංග කලාව

**7 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

නම/ විභාග අංකයඃ

## I - කොටස

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- අංක 01 - 05 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 '' අභිනය '' යන්නෙහි තේරුම,

(1) සංවාද භාවිතය යි.

(2) ඉදිරියට පැමිණවීමයි.

(3) සාමූහිකව කටයුතු කිරීමයි.

(4) පෙර නොවූ විරූ ලෙස යමක් නිර්මාණය කිරීමයි.

02 වෙදකමට ඉතා දක්ෂ වූ රජ කෙනෙකි.

(1) කාවන්තිස්ස රජු (2) ගජබා රජු

(3) බුද්ධදාස රජු (4) ශ්‍රී වික්‍රම රාජසිංහ රජු

03 වේෂභූෂණ අයත් වන්නේ,

(1) ආහාර්ය අභිනයට යි. (2) සාත්වික අභිනයටයි.

(3) ආංගික අභිනයට යි. (4) වාචික අභිනයට යි.

04 හඬ අභ්‍යාස ප්‍රගුණ කිරීම සඳහා භාවිත නොවන්නකි.

(1) නම් පොත (2) බුද්ධගජ්ජය (3) සකස්කඩ (4) සිරිත්මල්දම

05 ''අල්ලා බන්දා රන්දා බින්දා '' යන ගී පදය අයත් තූර්තිය වන්නේ,

(1) සිරිසඟබෝ (2) වෙස්සන්තර (3) දුටු ගැමුණු (4) විදුර

- අංක 06 සිට 10 දක්වා ඇති ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර තෝරා හිස්තැනෙහි ලියන්න.

( සිරිපැරකුම් / වෙද පුටුව / සමෝධානික / සුභ සහ යස / නාට්‍යෝපකරණ / සිරිත්මල්දම)

06 පරිකල්පන හැකියාව වර්ධනය කර ගැනීම සඳහා සිදු කරනු ලබන රංග අභ්‍යාසයකි....................................

07 රංගනයේ දී නළු නිළියන් විසින් භාවිතා කරන සහ වේදිකාවේ භාවිතා කරන වෙනත් භාණ්ඩ ....................................................... නම් වේ.

08 රංග කාර්යයේ දී සියලු චලන සිදුකරනුයේ මනස සහ සිරුර අතර ........................................................................ බවකින් යුතුවය.

09 ...................................................................... ඓතිහාසික කතා පසුබිම් කරගනිමින් නිර්මාණය වූ වේදිකා නාට්‍යකි.

10 හොඳ සිරිත් ප්‍රකට කරවන නාට්‍යෝචිත අවස්ථා ........................................................................ ඇසුරින් නිර්මාණය කළ හැකිය.

- **අංක 11 සිට 15 දක්වා ඇති ප්‍රකාශන හරිනම් (✓) ලකුණ ද, වැරදිනම් (✗) ලකුණ ද යොදන්න.**

11 නාට්‍යක කතාවස්තුවෙන් ප්‍රකාශ වන අදහස නාට්‍ය තේමාව ලෙස දැක්විය නොහැක. ( )

12 සමතලා භූමි ප්‍රදේශයක් වීම රංග භූමියක දැකිය හැකි විශේෂ ලක්ෂණකි. ( )

13 රූපවාහිනී නාට්‍යයක් රූපගත කිරීමේ දී සිද්ධි අනුපිළිවෙළින් පටිගත කිරීම අත්‍යවශ්‍ය වේ. ( )

14 වේදිකා නාට්‍යයක තිබෙන සජීවී ගුණය රූපවාහිනී නාට්‍යයකදී ද දැකිය හැකිය. ( )

15 නාට්‍යයකින් කියැවෙන පරිසර මැවීමට ස්වභාවික ලෝකයේ ඇති වස්තූන්ගේ හැඩතල, වර්ණ භාවිතා කළ හැකිය. ( )

- **අංක 16 සිට 20 දක්වා ඇති ප්‍රශ්න උපයෝගී කරගනිමින් ප්‍රහේලිකාව පුරවන්න.**

<u>හරහට</u>

16 තම පුද්ගල භාවයන් අමතක කොට වෙනත් පුද්ගල භාවයකට ප්‍රවේශ වීම මේ නමින් හඳුන්වයි.

17 නාටයක් රඟදක්වන ස්ථානය මේ නමින් හඳුන්වයි.

18 විකෘති, තලමල පිපිලා, සිංහබාහු ආදිය .................................................... නම් වේ.

<u>පහළට</u>

19 භරතමුණි පඬිවරයා විසින් රචිත නාට්‍ය ශාස්ත්‍රය නම් ග්‍රන්ථයෙහි දක්වා ඇති අභින ගණන

20 චරිතයෙක් තුළ දැකිය හැකි විවිධ පැතිකඩ මේ නමින් හඳුන්වයි.




( ලකුණු 20 )

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ. පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.**

01 පහත සඳහන් දෙබස කාණ්ඩය නියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

දොස්තර මාමා - කවුද ලෙඩා ?
යාළුවෝ - මෙන්න ලෙඩා
දොස්තර මාමා - මොනවද දූන් අමාරු ?
අම්මා - කිසිම දෙයක් කන්නෙ නෑ
I ළමයා - කිසිම දෙයත් බොන්නෙත් නෑ
අම්මා - කිසිම දෙයක් නැතුව අදට දවස් පහක් වෙනවා
දොස්තර මාමා - දවස් පහක් (පුදුමයෙන්)

(i) ඉහත සඳහන් දෙබස් ඛණ්ඩය කුමන නාට්‍යකින් උපුටා ගත්තක් ද? (ලකුණු 02)
(ii) එම නාට්‍යය නිර්මාණය කර ඇත්තේ කවුරුන් විසින්ද ? (ලකුණු 02)
(iii) එම නාට්‍යයේ තේමාව කුමක් ද? (ලකුණු 02)
(iv) මෙම නාට්‍යයේහි එන ප්‍රධාන චරිතයෙහි චරිත ලක්ෂණ 02 ක් ලියන්න. (ලකුණු 02)
(v) මෙහි දක්වෙන රංග විධානයක් ලියා දක්වන්න. (ලකුණු 02)

02 (i) රංග අභ්‍යාස යන්න කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02)
(ii) ශිථිලකරණ අභ්‍යාස යනු කුමක්ද? (ලකුණු 02)
(iii) ඔබ පංතිකාමරය තුළ ශිථිලිකරණ අභ්‍යාසය සිදු කළ ආකාරය පියවරෙන් පියවර ලියා දක්වන්න. (ලකුණු 06)

03 (i) ''අභිරූපණය '' යන්න පැහැදිලි කරන්න. (ලකුණු 02)
(ii) අභිරූපණය සඳහා භාවිතා නොවන අභිනය කුමක්ද? (ලකුණු 02)
(iii) අභිරූපණ රංගනයක් ඉදිරිපත් කිරීම සඳහා ඔබ යොදාගත් අවස්තා 03 ක් සඳහන් කරන්න. (ලකුණු 06)

04 (i) අනුෂාංගික කලා යන්න හඳුන්වන්න. (ලකුණු 02)
(ii) අනුෂාංගක කලා 04 ක් නම් කරන්න. (ලකුණු 04)
(iii) අනුෂාංගික කලාංග නාට්‍යයට භාවිතා කිරීමේ වැදගත්කම් 02 ක් ලියා දක්වන්න. (ලකුණු 04)

05 ''විවිද ද්‍රව්‍ය භාවිතා කරමින් සැකසූ වෙස්මුහුණු පැළඳ රංගනයෙහි යෙදීම සිසුන්ට ඉතා සතටක් ගෙන දෙන ක්‍රියාකාරකමක් විය.''

(i) මෙහි දී ඔබ වෙස්මුහුණු සැකසීම සඳහා භාවිතා කළ ද්‍රව්‍ය 04 ක් ලියන්න. (ලකුණු 02)
(ii) වෙස්මුහුණු පැළඳ නැටීමෙන් සිසුන්ට අත්වන වාසි 02 ක් ලියන්න. (ලකුණු 02)
(iii) ඔබ පන්තිකාමරයේ දී වෙස්මුහුණ සැකසූ ආකාරය පියවරෙන් පියවර ලියනන් (ලකුණු 06)

## පිළිතුරු පත්‍රය - I කොටස

01. ( ii ) 02. ( iii ) 03. ( i ) 04. ( iv ) 05. ( i ) 06. වෙද පුටුව 07. නාට්‍යෝපකරණ
08. සමෝධානික 09. සුභ සහ යස 10. සිරිත් මල්දම 11 ✗ 12 ✓ 13 ✗ 14 ✗
15 ✓ 16 සමාරෝපණය 17 රංග භූමිය 18 වේදිකා නාට්‍ය 19 සතරකී
20 භූමිකා

## II කොටස

01 (i) අමරගියා දිව්‍යලෝකෙ නාට්‍යය (ලකුණු 02)

(ii) පාලිත ලොකුපෝතාගම (ලකුණු 02)

(iii) වැරදි මතයක පිහිටා කටයුතු කළ අමර උපක්‍රමශීලීව නිවැරදි මාවතකට යොමු කිරීම මෙහි තේමාව වේ. (ලකුණු 02)

(iv) ඉතා ඉත්මනින් රැවටෙන සුළු අයෙකි / සතුන්ට, යහළුවන්ට, මවට ආදර කරුණාව දක්වීම (ලකුණු 02)

(v) පුදුමයෙන් (ලකුණු 02)

02 (i) රංගන ශිල්පීන් තම රංග කාර්ය සාර්ථක කර ගැනීම සඳහාත් තම ශාරීරික මානසික යෝග්‍යතාවය ඇතිකර ගැනීම සඳහාත් කරනු ලබන අභ්‍යාස හෙවත් ප්‍රායෝගික පුහුණුවීම් රංග අභයාසය වේ. (ලකුණු 02)

(ii) ශිථිලකරනය යනු සැහැල්ලු බවයි. සිරුරේ තද ගතිය තුරන් කර අවශ්‍ය පරිදි පේශී ලිහිල් කිරීමට සැලැස්වීම සඳහා කරනු ලබන අභ්‍යාස ශිථිලකරණ අභ්‍යාස වේ. (ලකුණු 02)

(iii) ශිථිලකරණ අභ්‍යාසයක් කළ ආකාරය පියවරෙන් පියවර ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 06)

03 (i) ආංගික අභිනය මුල් කරගෙන යම්කිසි ක්‍රියාවක් කර පෙන්වීම නැතහොත් වචන භාවිතයෙන් තොරව මිනිස් සිරුර උපයෝගී කරගෙන කිසියම් සිද්ධියක් නිර්මාණශීලීව ඉදිරිපත් කිරීම. (ලකුණු 02)

(ii) වාචික අභිනය (ලකුණු 02)

(iii) සිසු පිළිතුරු සඳහා ලකුණු ලබා දෙන්න. (ලකුණු 06)

04 (i) අනුෂාංගිත කලා යනු නාට්‍යයක් සාර්ථක කර ගැනීම සඳහා වේදිකාවට බැහැරින් යොදා ගන්නා සියලු කලාවන් අනුෂාංගික කලා ලෙස සැලකේ. (ලකුණු 02)

(ii) අංග රචනය, වේෂ භූෂණය, පසුතල නිර්මාණය, නාට්‍යෝපකරණ, නාට්‍ය සංගීතය (ලකුණු 04)

(iii) නළු රංගනය වඩාත් තීව්‍රකරලීම සඳහා / නාට්‍යයක අවස්ථාමතු කර දක්වීම සඳහා / නාට්‍යයක ස්ථාන මතු කර දක්වීම සදහා. (ලකුණු 04)

05 (i) වියලිකොළ, කොලපත්, රෙදිපටි, ඉලාස්ටික් පටි, කෝඩ් නූල් (ලකුණු 02)

(ii) සබකෝලයෙන් තොරව චරිත නිරූපණයට පහසු වීම / කලාත්මක බවක්, විචිත්‍රවයක් නාට්‍යයට එක් වීමට (ලකුණු 02)

(iii) නිවැරදි පිළිතුරු සඳහා ලකුණු ලබා දෙන්න. (ලකුණු 06)